රුහුණ විශ්වවිද්‍යාලය

**2017/2018 අධ්‍යයන වර්ෂය**

**ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පළමු සමාසික අවසාන පරීක්ෂණය**

**2018 දෙසැම්බර්/ 2019 ජනවාරි**

# MAE 5103 - ශ්‍රී ලංකාවේ ආර්ථිකය

එක් කොටසකින් ප්‍රශ්න දෙකක් (02) පමණක් තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) කට පිළිතුරු සපයන්න.

**කාලය: පැය 03 යි.**

---

## I කොටස

01\. I. ආර්ථික ගෝලීයකරණය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 03)

II. ලෝක වෙළඳාමට ගෝලීයකරණයේ බලපෑම ඔබ විග්‍රහ කරන්නේ කෙසේද?

(ලකුණු 06)

III. ගෝලීයකරණය මගින් සංවර්ධනය වන රටවලට ඇතිකරනු ලැබූ ධනාත්මක සහ සෘණාත්මක බලපෑම් කවරේද?

(ලකුණු 06)

02\. I. ශ්‍රම ඵලදායිතාව සහ සමස්ථ සාධක ඵලදායීතාව වෙන්කොට හඳුනාගන්න.

(ලකුණු 04)

II. ඵලදායිතාව සහ ආර්ථික වෘද්ධිය අතර සම්බන්ධය විස්තර කරන්න.

(ලකුණු 04)

III. ඵලදායිතාව ඉහළ දමා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පෙන්වා දෙන්න.

(ලකුණු 07)

03\. පහත සඳහන් ඒවායින් ඕනෑම තුනකට (03) විස්තරාත්මක සටහන් ලියන්න.

I. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාවයේ කැපී පෙනෙන ලක්ෂණ

II. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පහළ දමාගැනීම සඳහා අනුගමනය කරනු ලැබූ ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

III. දරිද්‍රතා හිතෛෂී ආර්ථික වෘද්ධිය

IV. ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික අස්ථායිතා ගැටළුව

(ලකුණු 15)

## IIකොටස

04\. I. වත්මන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ පසුබෑමට බලපා ඇති ප්‍රධාන සාධක කවරේද?

(ලකුණු 05)

II. ආහාර සුරක්ෂිතතාවය ශ්‍රී ලංකාව වැනි රටවලට වැදගත් වන්නේ ඇයි? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

III. වී වගාව කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකාව පාදක කොට විග්‍රහ කරන්න.

(ලකුණු 05)

05\. I. "ආර්ථිකයේ සමස්ථ ආයෝජන මට්ටම ඉහළ දමාගැනීම සඳහා ඍජු විදේශ ආයෝජන ආකර්ශණය කර ගැනීමට ශ්‍රී ලංකාව උත්සාහ දරයි." ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික තත්ත්වය තුළ මේ උත්සාහයට හිතකර සාධක කවරේ ද? සීමාවන් හෝ සංරෝධක වශයෙන් ක්‍රියාකරන සාධක කවරේ ද?

(ලකුණු 08)

II. "වර්තමාන වෙළඳ තුළනය වේගයෙන් පිරිහීමට භාජනය වී ඇත." මෙම ප්‍රකාශයේ පසුබිම තුළ සඳහන් ප්‍රධාන සාධක කවරේ ද? මෙම සිද්ධියේ ආර්ථික බලපෑම කෙසේ ද?

(ලකුණු 07)

06\. I. සංක්‍රමණික සේවකයින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත් වන්නේ කෙසේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 05)

II. මෑත අතීතයේ ශ්‍රී ලංකාවේ ජනගහනයේ වයස් ව්‍යුහයේ සිදු වූ ප්‍රධාන වෙනස්කම් හඳුන්වන්න.

(ලකුණු 05)

III. මෑත දශකයේ දී ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය සාපේක්ෂ වශයෙන් පහත මට්ටමක පැවතී ඇත. ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගීත්වය පහත් මට්ටමක් ගැනීමට හේතු කවරේ ද?

(ලකුණු 05)

@@@@@@@@@